**ශීර්ෂය 105 - ජනමාධ්‍ය අමාත්‍යාංශය**

------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 105 - ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 14 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 14 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂය තුළ යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම් SA-82 ආකෘතිය අනුව රු.7,790,850 ක් වුවත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.5,956,540 ක් ලෙස දැක්වීමෙන් රු.1,834,310 ක වෙනසක් විය. | මූල්‍ය වත්කම් අත්පත්කර ගැනීම්වල නිවැරදි වටිනාකම රු. 5,956,540 ක් වන අතර එම අගය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ නිවැරදිව දක්වා ඇත. SA-82 ආකෘතිය සඳහා තොරතුරු ඇතුළත් කිරීමට නව සිගාස් වෙබ් යෙදුම වෙත දත්ත උඩුගත කිරීමේදී සිදු වූ වැරදීමක් හේතුවෙන් වර්ෂය තුළ යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම් වටිනාකම රු.7,790,850 ක් ලෙස පෙන්වයි. | නිවැරදි අගයන් දැක්වීමට කටයුතු කළ යුතුය. |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මියගිය සේවකයෙකුගෙන් අයවිය යුතු රු. 36,576 ක් හා සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.198,502 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මියගිය සේවකයාගේ ණය මුදල අයකර ගැනීම සඳහා අදාළ ඇපකරුට හා ජාතික රක්ෂණ භාර අරමුදල වෙත දන්වා යවා ඇත. සේවය අතහැර ගිය නිලධාරියාගේ රු.198,502 ණය මුදල අදාළ | ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට අදාළ ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී. | |
| (ආ) | ආයතන සංග්‍රහයේ X11 පරිච්ඡේදයේ 23.10 වගන්තිය අනුව නිවාඩු දීර්ඝ කිරීමක් සඳහා අයදුම් කරන බවට නිවාඩු අනුමත කරන බලධාරියාගේ එකඟත්වය දිවයිනෙන් පිටත්ව යාමට පෙර අදාළ නිලධාරියා විසින් ලබාගෙන ඇත්නම් මිස, දිවයිනෙන් බැහැර නිවාඩු දීර්ඝ කිරිම නොකළ යුතු වුවද දින 85 ක වැටුප් සහිත සහ දින 08 ක වැටුප් රහිත  විදේශ නිවාඩු ලබා සිටි  නිලධාරියෙකුට වසර 02 ක් සඳහා වැටුප් රහිත විදේශ නිවාඩු දීර්ඝ කිරීම අනුමත කර  තිබුණි. එසේ නිවාඩු අනුමත කිරීමේදී රු. 232,105 ක්වූ ණය ශේෂය අයකර ගැනීම පිළිබඳ සැලකිලිමත් වී නොතිබුණු අතර  16.5 වගන්තිය අනුව 10 වැනි පරිශිෂ්ඨයේ සඳහන් පරිදි අත්සන් කළ  ගිවිසුම අසම්පූර්ණ ගිවිසුමක් විය. එමෙන්ම 23.18 වගන්තිය අනුව රජයේ නිලධාරීන් දිවයිනෙන් බැහැර ගතකරන නිවාඩු පිළිබඳ වාර්තාවක් මාස්පතා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | නිලධාරියා සාමාන්‍ය විදේශ නිවාඩුවක් ලෙස නිවාඩු අයදුම්කිරීම හා එම ඉල්ලීම අංශ ප්‍රධානියා විසින් නිර්දේශ කර තිබීමත්, රාජකාරියට බාධාවක් වී නොමැති බැවිනුත් මෙම නිලධාරියාගේ විදේශ නිවාඩුව අනුමත කර ඇත. එහිදී ආපදා ණය ශේෂය පරීක්ෂා කිරීම අතපසුවී ඇත.<br><br>ඉදිරියේදී අදාල තොරතුරු යැවීම සඳහා සටහන් කර ගන්නා ලදි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**(ඇ)  ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 891 ප්‍රකාරව ඇප ලේඛනය | ඇප ලේඛනය සකස් කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 447(5) ප්‍රකාරව බැරකම් ලේඛනය | බැරකම් ලේඛනය ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා අදාල අංශ වෙත උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකිවන පරිදි බැරකම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද මගින් ලබා ගැනීමට ඇස්තමේන්තු කර තිබූ ආදායම රු. 300,000,000 ක් වුවද අමාත්‍යාංශය ලද ශුද්ධ ආදායම රු.150,450,000 ක් වූයෙන් සියයට 50 කට ආසන්න ප්‍රමාණයකින් ආදායම අඩුවෙන් රැස්කර තිබුණි. | රූපවාහිනී නාලිකාවන්හි පැවැති මූල්‍ය අර්බුදය හේතුවෙන් බදු ගෙවා විකාශනය කරන ටෙලි නාට්‍ය හා චිත්‍රපට විකාශය අවම කරන ලදී. | ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේ ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වානිජ වැඩසටහන් බද්ද මගින් ලබාගත් ආදායම රු. 215,020,000 ක් වූ අතර 2023 වර්ෂයේදී එය රු. 150,450,000 ක් වීමෙන් 2022 වර්ෂයට වඩා සියයට 30 කින් පමණ ආදායම අඩුවී තිබුණි. | රූපවාහිනී නාලිකාවන්හි පැවැති මූල්‍ය අර්බුදය හේතුවෙන් බදු ගෙවා විකාශනය කරන ටෙලි නාට්‍ය හා චිත්‍රපට විකාශය අවම කරන ලදී. | ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වානිජ වැඩසටහන් බද්දේ හිඟ මුදල වූ රු. 25,220,500 අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ පුනරාවර්තන වැය විෂයයක් සඳහා සලසා තිබූ ප්‍රතිපාදනයෙන් රු. 4,490,000 ක් වෙනත් පුනරාවර්තන වැය විෂයයන් 04 ක් වෙත මු.රෙ **66** මගින් මාරු කර තිබූ බැවින් මුදල් රෙගුලාසිවල අවශ්‍යතා සපුරාලන පරිදි කටයුතු කරමින් තාත්ත්විකව ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. | වියදම් පාලනය පිළිබඳ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛවලට අනුගතව කටයුතු කිරීම හේතුවෙන් 2023 වර්ෂය සඳහා වෙන් කර තිබූ පුනරාවර්තන හා මූලධන වියදම් ප්‍රතිපාදන උපයෝජනය කිරීම සීමා විය. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | වැය විෂයයන් 02 ක් සඳහා සලසාගෙන තිබූ රු.2,322,800 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන වලින් සියයට 100 ක් හා තවත් වැය විෂයයන් 12 ක් සඳහා සලසාගෙන තිබූ රු.405,410,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.373,083,146 ක් උපයෝජනය නොකර පැවති අතර එය සියයට 60 සිට සියයට 98 දක්වා ප්‍රතිශතයක් විය. | වියදම් පාලනය පිළිබඳ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛවලට අනුගතව කටයුතු කිරීම හේතුවෙන් 2023 වර්ෂය සඳහා වෙන් කර තිබූ පුනරාවර්තන හා මූලධන වියදම් ප්‍රතිපාදන උපයෝජනය කිරීම සීමා විය. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැඳීම් හා බැරකම් පිළිබඳ තවදුරටත් සිදුකළ යුතු ගැලපීම් සිදුකර භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමට කටයුතු නොකිරීම නිසා නව CIGAS වෙබ් යෙදුම මගින් ජනනය කරන ලද සමුච්චිත බැඳීම් හා බැරකම් වාර්තාව (SA 92) යටතේ 2020, 2021 හා 2022 වර්ෂවල වටිනාකම්ද ඇතුළත් වී තිබුණි. | ඉදිරියේදී අදාල වාර්තා යාවත්කාලීන කර ඉදිරිපත් කිරීම සඳහා අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. | බැඳීම් හා බැරකම් පිළිබඳ තවදුරටත් සිදුකළ යුතු ගැලපීම් සිදුකර භාණ්ඩාගාරය වෙත වාර්තා කර ඉකුත් වර්ෂවල ශේෂ නිරවුල් කර ගත යුතුය. |

## 2.4 ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණකාධිකාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළයුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණකාධිකාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය පාලනය සඳහා වන සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ ප්‍රධාන ගණකාධිකාරී විසින් සිදු කරන සමාලෝචනය ඉදිරි මුදල් වර්ෂයේදී සිදු කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (i) මු.රෙ. 187 | 3,595,875 | මුදල් රෙගුලාසියට පටහැනිව ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය විසින් රැස් කරන ලද රු. 3,595,875 ක් දින 02 සිට දින 17 ක් දක්වා ප්‍රමාද කර බැංකුගත කර තිබුණි. | හැකිතාක් එදිනම මුදල් බැංකුගත කිරීමට උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව රැස් කරන ලද මුදල් නොපමාව බැංකුගත කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (ii) මු.රෙ.880 | - | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව නිලධාරීන් 15 දෙනෙකු පමණ ඇප තබා නොතිබුණි. | ඇප අයකිරීමට කටයුතු කරමින් පවතී. | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතුය. |
| (ආ) | 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 05 ඡේදය | - | පවතින ආර්ථික තත්ත්වයන්ගේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු එම සේවාවන් සැපයීම සඳහා වන වියදම් පිළිබඳව සලකා කාලානුරූපීව සංශෝධනය කළයුතු වුවද, එසේ සිදුකර නොතිබුණි. | බදු සංශෝධනයන් 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිතය. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කාලානුරූපීව ගාස්තු සංශෝධනය කළ යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ | | | | |
| | (i) I කොටසේ 9 මගින් සංශෝධිත මු.රෙ. 371(5) ඡේදය | 824,922 | තත්කාර්යය අතුරු අග්‍රිමය ලබාගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිම පියවිය යුතු වුවත්, එකතුව රු.824,922 ක් වූ අත්තිකාරම් 19 ක් දින 22 සිට දින 112 ක පරාසයක් දක්වා පියවීම ප්‍රමාද කර තිබුණි. | කාර්ය නිමකර දින 10 ක් තුළ අත්තිකාරම් පියවීම සඳහා මාණ්ඩලික නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදි. | ලබාගත් තත්කාර්යය අතුරු අග්‍රිම චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව පියවිය විය යුතුය. |
| | (ii)I කොටසේ 11.1 මගින් සංශෝධනය කරන ලද මු.රෙ. 756(6) | - | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර අවසන් වූ වහාම වාර්තාව ලබාදීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2016 මාර්තු 09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2016 හි 02 | 260,000 | ප්‍රවාහන දීමනාව ලබාගන්නා නිලධාරියෙකු වැටුප් සහිතව හෝ වැටුප් රහිතව දින 30 කට වැඩි කාල සීමාවක් නිවාඩු ලබා ගන්නේ නම් එකී නිලධාරියාට එම කාල | එම මුදල 2024 ජනවාරි මස සිට 2024 දෙසැම්බර් මස දක්වා වාරික 12 කින් අයකර | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (vii) ඡේදය | | සීමාව සඳහා ප්‍රවාහන හෝ ඉන්ධන දීමනාව නොගෙවිය යුතු වුවත් වැටුප් සහිතව විදේශ නිවාඩු දින 35 ක් ලබාගෙන තිබූ නිලධාරියෙකුට ප්‍රවාහන හා ඉන්ධන දීමනාව ගෙවා තිබුණි. | ගැනීමට කටයුතු කරනු ලැබේ. වාරික 04 ක් මේ වන විට අයකර ඇත. | |
| (ඊ) | 1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 1,326,000 | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා චිත්‍රපට, DVD හා කෙටිකතා සමීක්ෂණය සඳහා ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ කමිටු සාමාජිකයන් සඳහා රු. 1,326,000 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. | 2023 මාර්තු 31 දින සිට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ගෙවීම් සඳහා නිසි පරිදි අනුමැතිය ලැබී ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2.6 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පදනමින් සේවය කරන නිලධාරියෙකු වැඩ බැලීමේ පදනම මත වෙනත් ආයතනයක පත්වීමක් ලැබීමට ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන සලසාදී නොමැති අතර කොන්ත්‍රාත් පදනමින් සේවය කරන ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාවය මත රාජ්‍ය ව්‍යවස්ථාපිත ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකරණ ඒකකයේ අධ්‍යක්ෂ (මාධ්‍ය) ලෙස වැඩබැලීමේ පදනමට පත්කර තිබුණි. එම කාලය සඳහා අමාත්‍යාංශය විසින් දීමනා ලෙස රු.917,310 ක් ගෙවා තිබුණි. | පවතින බඳවා ගැනීම් සීමාකර ඇති තත්ත්වය තුළ නිළධාරීන් වැඩ බැලීමට පත්කිරීම සාමාන්‍යයෙන් සිදුවේ. ඒ අනුව අදාළ අධ්‍යක්ෂ සඳහා ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානයේ රාජකාරියට බාධා නොවන පරිදි වැඩබැලීමට අනුමැතිය ලබා දී ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය විසින් ඉදිරිපත් කළ ප්‍රගති වාර්තාව අනුව 2023 වර්ෂයේ ක්‍රියාකාරකම් වල භෞතික හා මූල්‍ය ප්‍රගතියක් නිරීක්ෂණය නොවුණි. රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය නිවැරදිව ජනතාව වෙත සන්නිවේදනය කිරීමේ අරමුණින් මධ්‍යස්ථානය ස්ථාපිත කර තිබුණද මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණ ඉටුවී නොතිබුණි. | ක්‍රියාත්මක සැලසුමේ ඇති වැඩසටහන් සඳහා රාජ්‍ය අරමුදල් වෙන් නොකිරීම මත භෞතික හා මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කිරීමට අපොහොසත් වුවද, ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථාන නිලධාරීන් සියල්ල ලැබී ඇති අවම පහසුකම් යටතේ රාජ්‍ය ප්‍රතිපත්තිය හා සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය | මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණු ඉටුකරගත හැකිවන පරිදි කාර්යභාරයන් සැලැසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

නිවැරදිව හා කාර්යක්ෂමව නව මාධ්‍ය උපයෝගී කර ගෙන අඛණ්ඩව ජනතාව අතරට ගෙන යාමේ මාධ්‍ය මෙහෙවර ක්‍රියාත්මක කරමින් සිටි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සියලුම රජයේ අමාත්‍යාංශ අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කළ යුතු අතර, ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය. අමාත්‍යාංශය එසේ සිදුකර නොතිබුණු අතර විගණකාධිපති වෙත ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කර තිබුණේ 2023 ජනවාරි 18 දිනදීය. | ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා විදේශාධාර ලබාදීම සීමා කිරීම හේතුවෙන් එම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නැවත නිශ්චය කර ගැනීමට අමතර කාලයක් අවශ්‍ය වූ බැවින් ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්ම නිශ්චිත කාල සීමාව තුළ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 26 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | නව ව්‍යාපෘති යෝජනා නොකැඳවීම, ප්‍රතිපාදන ලබා නොදීම, ආර්ථික අර්බුදය, අනුග්‍රාහකයින් සම්බන්ධ කර ගැනීමට නොහැකි වීම ආදී හේතු නිසා ක්‍රියාත්මක නොකළ බව දක්වා තිබුණි. | ප්‍රායෝගික තත්වයන් සලකා බලා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ක්‍රියාකාරී සැලැස්ම තුළ නොමැති වුවද ප්‍රගතිය තුළ ක්‍රියාකාරකම් 26 ක් පැවතුණු අතර ආයතන හා පරිපාලන අංශයේ ක්‍රියාකාරකම් 06 ක මූල්‍ය කාර්යසාධනය සියයට 25 සිට සියයට 99 දක්වා පැවතියද භෞතික කාර්යසාධනය නොතිබුණි. | මාධ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ කටයුතු ආරම්භය ප්‍රමාදවීම, රජයේ මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව සිදුකර තිබීම වැනි හේතුද, භෞතික කාර්යසාධනය නොතිබීමට හේතු ඉදිරිපත් කර නොතිබුණි. | සියළු ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළ යුතු අතර භෞතික කාර්යසාධනය නියමිත පරිදි ළඟා කරගත යුතුය. |
| (ආ) | අමාත්‍යාංශයේ සියළු අංශ ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ ක්‍රියාකාරකම් ඇතුළත් කර නොතිබුණි. | ලේකම්තුමාගෙන් ලැබුණු උපදෙස් අනුව 2025 වර්ෂයේ සිට එම ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මට එකතු කිරීමට කටයුතු කරනු ලැබේ. | අමාත්‍යාංශයේ සියළු අංශ ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකාවේ භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ ව්‍යාපෘතිය 2014 ආරම්භ කළද ක්‍රියාත්මක නොවීම නිසා නැවත 2021 වර්ෂයේ කැබිනට් මණ්ඩල තීරණයක් පරිදි යාවත්කාලීන කරන ලද අතර, තාක්ෂණය සමග ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී තිබුණි. ඒ තුළින් රට පුරා විසිරී පවතින විකාශනාගාර 16 ක් ස්ථාපිත කිරීමට නියමිත වුවත්, 2024 මැයි 31 වන විටත් එක් විකාශනාගාරයක් හෝ ස්ථාපිත කිරීමට නොහැකිවී තිබුණි. | JICA ආයතනය විසින් අරමුදල් නිදහස් කිරීම තාවකාලිකව නවතා ඇති හෙයින් ගිවිසුම අත්සන් කිරීමද ඉන් පසුව ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමද මෙතෙක් සිදු කිරීමට නොහැකි වී ඇත. | ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට පියවර ගත යුතුය. |

## 3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සියලුම ගණන් දීමේ නිලධාරීන් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයයන් හා කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමුකළ යුතු වුවත් 2023 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම එම දිනට පෙර සකස් කර අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර විගණනයට 2023 මැයි 15 දින ඉදිරිපත් කර තිබුණි. | අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන සැලැස්ම 2022 දෙසැම්බර් 10 දිනට පෙර සකස් කිරීමට නොහැකි වී ඇති බව පිළිගනිමි. එහෙත් 2023 ජනවාරි 31 වන දින සකස් කර ඇත. එහි පිටපතක් විගණකාධිපති වෙත එම අවස්ථාවේ යොමු කිරීමට අතපසුවීම හේතුවෙන් 2023 මැයි 15 වන දින ඉදිරිපත් කර ඇත. | ඉදිරි වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම නියමිත කාලපරිච්ඡේදයන් තුළ අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර සකස් කළ යුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී අමාත්‍යාංශයේ සියළු අංශවලින් තොරතුරු කැඳවා වර්ෂ 3 ක් සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය.ෙ |
| (ඇ) | සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම තුළ පවතින ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ සිනමාශාලා නවීකරණය, ප්‍රසම්පාදන සැලැස්මේ කාර්යසාධනය තුල ඇතුලත් වී නොතිබුණි. | එකඟ වේ.<br><br>ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්මේ කාර්ය සාධනය පිළියෙල කිරිමේදී සියළු ප්‍රසම්පාදන කාර්යයන් ඇතුළත් කිරීමට උත්සාහ කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

## 3.5 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයට අයිතියක් නොමැති රථයක අලුත්වැඩියාව පිළිබඳව යාන්ත්‍රික ඉංජිනේරු විසින් ලබාදී ඇති නිරීක්ෂණය අනුව රථයේ ඉන්ධන වලට ජලය කාන්දුවීම හා ඉන්ධන ටැංකියේ ඉන්ධන අවසන් වනතෙක් ධාවනය කිරීම මෙම අලුත්වැඩියාව සඳහා හේතු වී ඇති බැවින් වගකිවයුතු පුද්ගලයන් හඳුනා ගැනීමට අවධානය යොමු නොකර අලුත්වැඩියාව සඳහා රු.1,687,250 ක් වැයකර තිබුණි. | විදුලිබල අමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩල සංශෝධනයේදී ජනමාධ්‍ය අමාත්‍යවරයා ලෙස පත්ව එනවිට මෙම රථය මෙම අමාත්‍යාංශය වෙත රැගෙන එන ලදි. නැවත අමාත්‍ය මණ්ඩල සංශෝධනයේදී දී මෙම රථය පසුව පැමිණි අමාත්‍යවරයා වෙත භාරදෙන ලදි. මෙම වාහන හුවමාරු අවස්ථාවේ මෙම අළුත්වැඩියාව මතු වූ බැවින් හානියට වගකිවයුතු අයකු නිශ්චිතව හඳුනාගත නොහැකි විය. | වගකිවයුතු පාර්ශවයන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඉදිකර තිබූ ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය ස්ථාපිත කර තිබෙන ගොඩනැගිල්ලේ පවතින සිනමාශාලාව 2024 ජනවාරි 23 දින දක්වාම ක්‍රියාකාරී තත්වයට පත්කර නොතිබීම නිසා එක චිත්‍රපටියක් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් කුඩා සිනමා ශාලාවකට රු.25,000 ක ගාස්තුවක් අදාළ පුද්ගලයින් විසින් ගෙවිය යුතු අතර 2023 ජනවාරි 01 දින සිට 2023 අගෝස්තු 31 දක්වා දේශීය හා විදේශීය චිත්‍රපටි 146ක් පමණ නිරීක්ෂණය කර තිබීම නිසා රු.3,650,000 ක ආදායමක් ආයතනයට අහිමි වී තිබුණි. | වර්තමානය වන විට (2024.01.23) තිරය සවිකර ඇති අතර වැඩ කටයුතු 95% ක් පමණ අවසන් කර ඇත. ප්‍රක්ශේපණ යන්ත්‍රයේ අක්‍රිය වී ඇති කොටස් යථා තත්ත්වයට පත් කිරීම සඳහා අදාල ආයතනයට දන්වා ඇත. ඒ සඳහා ප්‍රතිපාදන 2024 වර්ෂයේ අයවැයෙන් වෙන් කර නොතිබූ බැවින් මේ සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලෙස භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කර ඇත. එම ප්‍රතිපාදන ලද වහාම එම කටයුතු අවසන් කළ හැකි අතර ඉන්පසු චිත්‍රපට පූර්ව දර්ශනය කිරීමට හැකියාව ඇත. | ආදායම රැස්කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | 2015 වර්ෂයේදී මිළදී ගන්නා ලද ඩීසීපී යන්ත්‍රය මේවන විට ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින බැවින් එහි පැවැත්ම හා තාක්ෂණය සම්බන්ධව පරීක්ෂාකර නිසි පරිදි ක්‍රියාකරන බවට වගකීම් සහතිකයක් ලබාගෙන නොතිබුණි. | ඩී.සී.පී. යන්ත්‍රයේ පැවැත්ම සහ තාක්ෂණය පිළිබඳව තත්ත්ව වාර්තා ලබාගෙන ඇති අතර ඒ අනුව අදාළ කොටස් සවි කිරිමෙන් නිසි පරිදි ක්‍රියා කරන බව අදාළ ආයතනයෙන් තහවුරු කර ඇත. ඒ සම්බන්ධව වගකීම් සහතිකයක් ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | යන්ත්‍ර වල තතත්වය නිසි ආකාරයෙන් පවත්වා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2023 ජූලි 31 දිනට ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ ප්‍රගතියට අනුව ප්‍රාග්ධන හා පුනරාවර්තන සමස්ථ වියදම රු. 5,351,544 ක් වූ අතර සමස්ථ ආදායම රු. 3,572,875 ක් විය. ඒ අනුව ආදායමට සාපේක්ෂව වියදම රු.1,778,669 කින් වැඩිවී තිබීමෙන් ආයතනයේ ප්‍රගතියේ පසුබෑමක් විය. | එම වර්ෂයේ රටෙහි පැවති ආර්ථික තත්ත්වයන් මත චිත්‍රපට ගෙන්වීම, නාට්‍ය, සංදර්ශන නිෂ්පාදනය අඩු මට්ටමක තිබීම නිසා ආදායම අඩුමට්ටමක පැවතුණි. එබැවින් ආයතනයේ මූල්‍ය ප්‍රගතියේ අඩුවීමක් පෙන්නුම් කර ඇත. | ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. යහපාලනය**

**4.1 පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව 2023 වර්ෂයට අදාළව සකස් කළ මානව සම්පත් සැලැස්ම තුළ චක්‍රලේඛයේ 6.1 ඡේදයට අදාළ කාර්යසාධන ඇගයීම් ගිවිසුම් අත්සන් කර නොතිබුණු අතර පුහුණුවේ ප්‍රතිඵලය ඇගයීම සඳහා වන යාන්ත්‍රණය සකස් කර නොතිබුණි. | අංක 02/2018 චක්‍රලේඛයට අනුව සේවාලාභී ප්‍රඥප්තිය යටතේ කාර්යසාධන ඇගයීම් ගිවිසුම් 2024 වර්ෂය සඳහා සකස්කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2023 වර්ෂය සඳහා කළමනාකරණ මණ්ඩලයෙන් අනුමත කළ අභ්‍යන්තර විගණන සැලැස්ම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු වැඩ බලන පදනමින් 2023 මැයි මස සිට පත්කර ඇති බැවින් කළමනාකරණ කමිටුව වෙතින් අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කර ගැනීම ප්‍රමාද විය. 2024 වර්ෂයේ කළමනාකරණ මණ්ඩලයෙන් අනුමත කරන ලද විගණන සැලැස්ම මේ වන විට විගණනයට ඉදිරිපත් කර ඇත. | අභ්‍යන්තර විගණන සැලැස්ම විගණනයට ඉදිරිපත් කළ යුතුය. |